සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது /
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය, දකුණු පළාත් සභා පාසල්වල පවතින
ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් බඳවා ගැනීම - 2016


**(02) සාමාන්‍ය දැනීම**

පැ එකයි

## විභාග අපේක්ෂකයින්ට උපදෙස්

ඉතා වැදගත් :

පිළිතුරු ලිවීම සඳහා පැන්සල
භාවිත නොකරන්න.



✳ පිළිතුරු සැපයීමේ දී පහත සඳහන් ආකාරයට ඉලක්කම් ලියා නැති උත්තර පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.

**1 2 3 4**

ඔබේ විභාග අංකය මෙහි ද තුන්වන පිටුවෙහි ඇති තිත් ඉර මත ද ලියන්න.

....................................

නිවැරදි බවට නිරීක්ෂකගේ
කෙටි අත්සන

....................................

වැදගත් :

✳ මෙම ප්‍රශ්න පත්‍රය පිටු **6** කින් හා ප්‍රශ්න **50** කින් යුක්ත වේ.

✳ පිළිතුරු ලිවීමට පෙර ප්‍රශ්න පත්‍රය පිටු අංක අනුව සකසා ගන්න.

✳ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.

✳ මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය පැය එකකි.

✳ ශාලාධිපතිවරයා නිවේදනය කළ පසු පිළිතුරු ලිවීම ආරම්භ කරන්න.

✳ දී ඇති උපදෙස් අනුව ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු වන අතර උපදෙස්වලට පටහැනිව සපයන පිළිතුරු සඳහා ලකුණු දෙනු නොලැබේ.

✳ ඔබට සැපයීමට පිළිතුරු නැතත් මෙම පිළිතුරු පත ශාලාධිපතිට භාර දිය යුතුය.

✳ ඔබේ පිළිතුරු පැහැදිලි ලෙස නිල් හෝ කළු පෑනෙන් පමණක් ලියන්න. පැන්සල් පාවිච්චි නොකරන්න.

✳ මෙම ප්‍රශ්න පත්‍රය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම හෝ එහි ඡායා පිටපත් ගැනීම හෝ වරදකි.

✳ **අපැහැදිලි ඉලක්කම්, අපැහැදිලි අත් අකුරු සහිත, මකන දියර භාවිත කරන ලද සහ පැන්සලෙන් පිළිතුරු සපයන ලද පිළිතුරු පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.**

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි**

| පිටුව | ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|---|
| 2 | 1 - 9 | |
| 3 | 10 - 17 | |
| 4 | 18 - 27 | |
| 5 | 28 - 38 | |
| 6 | 39 - 50 | |
| එකතුව | | |

**අවසාන ලකුණු**

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරින් | |

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක | |
| ලකුණු පරීක්ෂා කළේ | |

[ 2 වැනි පිටුව බලන්න.

- අංක 1 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා, එට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

1. දකුණු පළාතේ ඇති මුළු පාසල් සංඛ්‍යාව දළ වශයෙන්,
   (1) 1000 කි. (2) 1100 කි. (3) 1200 කි. (4) 1300 කි. (.........)

2. එක්තරා පාසලක මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 1200 කි. එහි 1 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා පන්ති පැවැත්වේ. උසස් පෙළ කලා හා වාණිජ විෂය ධාරා ඇත. එම පාසල අයත්වන පාසල් වර්ගය කුමක් ද?
   (1) 1 A (2) 1 AB (3) 1 C (4) II (.........)

3. පළාත් සභා පාසල් නමින් පාසල් වර්ගයක් ඇති වූයේ පහත සඳහන් කුමන වර්ෂයේ කළ ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණ යටතේ ද?
   (1) 1972 (2) 1978 (3) 1988 (4) 2006 (.........)

4. පළාත් සභාවක ජනාධිපතිවරයාගේ නියෝජිතයා වන විධායක නිලධරයා වන්නේ,
   (1) ප්‍රධාන අමාත්‍යවරයා ය.
   (2) ප්‍රධාන ලේකම්වරයා ය.
   (3) ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම්වරයා ය.
   (4) පළාත් ආණ්ඩුකාරවරයා ය. (.........)

5. පළාත් සභාවට අයිති පාසලක් ජාතික පාසලක් ලෙස උසස් කිරීම කරනු ලබනුයේ,
   (1) පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා විසිනි.
   (2) පළාතේ අධ්‍යාපන අමාත්‍යවරයා විසිනි.
   (3) පළාතේ ආණ්ඩුකාරවරයා විසිනි.
   (4) මධ්‍යම අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන ඇමතිවරයා විසිනි. (.........)

6. පළාත් සභා පාසල්වල ගුරුවරුන්ගේ පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන යනු ලබන්නේ,
   (1) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් ය.
   (2) කලාප අධ්‍යාපන කාර්යාලයෙන් ය.
   (3) කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් ය.
   (4) පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ කාර්යාලයෙන් ය. (.........)

7. කලාපයක පිහිටි ගුරු මධ්‍යස්ථානයක ප්‍රධානියා වශයෙන් පත්කළ යුත්තේ,
   (1) ගුරු අධ්‍යාපන සේවයේ නිලධාරියෙකි.
   (2) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියෙකි.
   (3) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරියෙකි.
   (4) ගුරු උපදේශකවරයෙකි. (.........)

8. ළමයකු පාසලට ඇතුළත් කිරීමේ දී අත්‍යවශ්‍ය වන ලේඛනයක් වන්නේ,
   (1) ශිෂ්‍ය කාර්ය දර්ශකයයි.
   (2) ළමයාගේ උප්පැන්න සහතිකයයි.
   (3) දෙමව්පියන්ගේ පදිංචිය පිළිබඳ ග්‍රාම නිලධාරි සහතිකයයි.
   (4) ළමයාගේ භාරකරුගේ උප්පැන්න සහතිකයයි. (.........)

9. පහත සඳහන් අය අතුරින් පාසල් සංවර්ධන සමිතියේ සාමාජිකත්වය ලබාගත නොහැකි වන්නේ,
   (1) ශිෂ්‍යයන්ගේ දෙමව්පියන්ට ය.
   (2) ශිෂ්‍යයන්ගේ නීත්‍යානුකූල භාරකරුවන්ට ය.
   (3) පාසලේ සේවය කරන ගුරුවරුන්ට ය.
   (4) පාසලෙන් විශ්‍රාම ලබා ඉවත්ව ගිය ගුරුවරුන්ට ය. (.........)

[ 3 වැනි පිටුව බලන්න.

10. පාසලක ළමයින් අධ්‍යාපන චාරිකාවක යෙදෙන්නේ නම්, ඒ සඳහා අනුමැතිය ලබාගත යුත්තේ,
(1) එම විදුහලේ විදුහල්පතිවරයාගෙනි.
(2) කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගෙනි.
(3) කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගෙනි.
(4) අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙනි. (.........)

11. පාසලක ආපනශාලාව පාලනය කළ යුත්තේ,
(1) විදුහල්පතිවරයා විසිනි.
(2) විදුහල්පතිවරයා නම් කළ ගුරුවරයකු විසිනි.
(3) කොට්ඨාස අධ්‍යාපන නිලධාරියාගේ නියෝජිතයකු විසිනි.
(4) පාසල් ආපන ශාලා කමිටුව විසිනි. (.........)

12. පාසලක සිසුන්ගේ වෛද්‍ය පරීක්ෂණ පවත්වනු ලබන්නේ,
(1) සෞඛ්‍ය හා පෝෂණය භාර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසිනි.
(2) ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසිනි.
(3) ආසන්නතම රෝහලේ වෛද්‍යවරයකු විසිනි.
(4) කොට්ඨාසයේ පවුල් සෞඛ්‍ය සේවිකාව විසිනි. (.........)

13. ආධාර ලබන පාසල් රජයට පවරා ගනු ලැබුයේ,
(1) 1956 දී ය. (2) 1960 දී ය. (3) 1972 දී ය. (4) 1981 දී ය. (.........)

14. පාසල් රජයට පවරාගත් අවස්ථාවේ දී රජයට පවරා නොගෙන එහෙත් රජයේ ආධාර දීම දිගටම කරගෙන ගිය පාසල් නම්,
(1) විශේෂ අධ්‍යාපනය සඳහා වූ පාසල් ය.
(2) පළමුවන ශ්‍රේණියේ ආධාර ලැබූ පාසල් ය.
(3) ආගමික නිකායයන්ට අයත් පාසල් ය.
(4) ජාත්‍යන්තර පාසල් ය. (.........)

15. පාසල් ළමයින්ට නොමිලයේ නිලඇඳුම් ලබාදීම ආරම්භ කරන ලද්දේ කුමන ජනාධිපතිතුමාගේ පාලන සමයේ දී ද?
(1) විලියම් ගොපල්ලව ජනාධිපතිතුමා
(2) ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා
(3) ආර්. ප්‍රේමදාස ජනාධිපතිතුමා
(4) ඩී.බී. විජේතුංග ජනාධිපතිතුමා (.........)

16. පහත සඳහන් වියතුන් අතුරින් පාඨශාලා පරීක්ෂකවරයකු ලෙස සේවය කළ අයෙකු වන්නේ කවුද?
(1) මාර්ටින් වික්‍රමසිංහ
(2) මුණිදාස කුමාරතුංග
(3) පියදාස සිරිසේන
(4) අරිසෙන් අහුබුදු (.........)

17. පහත සඳහන් අධ්‍යාපන ඇමතිවරුන් අතුරින් දකුණු පළාතෙන් බිහි වූ අධ්‍යාපන ඇමතිවරු කවරහු ද?
(1) සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මහතා, රිචර්ඩ් පතිරණ මහතා, වි.ජ.මු. ලොකුබංඩාර මහතා
(2) විජයානන්ද දහනායක මහතා, බදියුද්දීන් මහමුද් මහතා, පී.බී.ජී. කලුගල්ල මහතා
(3) සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මහතා, විජයානන්ද දහනායක මහතා, රිචර්ඩ් පතිරණ මහතා
(4) විජයානන්ද දහනායක මහතා, රිචර්ඩ් පතිරණ මහතා, නිශ්ශංක විජේරත්න මහතා (.........)

[ 4 වැනි පිටුව බලන්න.

18. නිදහස් අධ්‍යාපන පනත සම්මත වූයේ කුමන වර්ෂයේ ද?
    (1) 1939 (2) 1947 (3) 1953 (4) 1962 (.........)

19. පහසුකම් හා සේවා ගාස්තු වශයෙන් ශිෂ්‍යයකුගෙන් මසකට අයකර ගත හැකි උපරිම මුදල කොපමණ ද?
    (1) රුපියල් 3.00 (2) රුපියල් 5.00 (3) රුපියල් 8.00 (4) රුපියල් 10.00 (.........)

20. අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති ආයතන අතුරින් අධ්‍යාපනවේදී උපාධියක් ලබාගත හැක්කේ පහත සඳහන් කුමන ආයතනයෙන් / ආයතනවලින් ද?
    (1) ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ
    (2) ගුරු අභ්‍යාස විද්‍යාල
    (3) ජාතික අධ්‍යාපන ආයතනය
    (4) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව (.........)

21. ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ භාරව අධ්‍යාපන අමාත්‍යාංශයේ සිටින නිලධාරිවරයාගේ නිල නාමය කුමක් ද?
    (1) ගුරු අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපන අධ්‍යක්ෂ
    (2) ප්‍රධාන කොමසාරිස් - ගුරු අධ්‍යාපන
    (3) අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්
    (4) අතිරේක ලේකම් ගුරු අධ්‍යාපන (.........)

22. ජාතික අධ්‍යාපන ආයතන පනත පැනවූයේ කුමන වර්ෂයේ ද?
    (1) 1980 (2) 1985 (3) 1991 (4) 1996 (.........)

23. අ.පො.ස. (සා.පෙළ) පන්තිවල විෂය මාලාවේ හර විෂය සංඛ්‍යාව කොපමණ ද?
    (1) 3 (2) 4 (3) 6 (4) 8 (.........)

24. ද්විභාෂා අධ්‍යාපන වැඩ සටහන යටතේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්විය නොහැකි විෂයයන් මොනවා ද?
    (1) සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය හා ඉතිහාසය
    (2) ආගම හා සමාජ අධ්‍යයනය
    (3) ඉතිහාසය හා භූගෝල විද්‍යාව
    (4) ආගම හා ඉතිහාසය (.........)

25. අ.පො.ස. (උ.පෙළ) පන්තිවල තාක්ෂණ විෂය ධාරාව හදාරන සිසුන් විසින් තාක්ෂණ අංශ දෙකකින් එකක් තෝරා ගත යුතු ය. එම තාක්ෂණ අංශ දෙක කවරේ ද?
    (1) ඉංජිනේරු තාක්ෂණවේදය, ජෛව පද්ධති තාක්ෂණය
    (2) ඉංජිනේරු තාක්ෂණවේදය, තොරතුරු තාක්ෂණවේදය
    (3) කෘෂි තාක්ෂණය, විද්‍යුත් තාක්ෂණය
    (4) ජෛව පද්ධති තාක්ෂණය, ඉදිකිරීම් තාක්ෂණය (.........)

26. හදිසි අවස්ථාවල දී ළමයින්ට උපකාර කිරීම සඳහා පිහිටුවා ඇති එක්සත් ජාතීන්ගේ විශේෂ ආයතනය කුමක් ද?
    (1) යුනිසෙෆ් (UNICEF)
    (2) එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන (UNDF)
    (3) යුනෙස්කෝව (UNESCO)
    (4) ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) (.........)

27. පහත සඳහන් වරණවලින් අධ්‍යාපන මනෝ විද්‍යාඥයන්ගේ නම් පමණක් සඳහන් වරණය කුමක් ද?
    (1) සිග්මන් ෆ්‍රොයිඩ්, කාර්ල් යන්ග්, ඉවාන් පැව්ලෝ
    (2) ජීන් පියාජේ, ඒබ්‍රහම් මාස්ලෝ, බී.එෆ්. ස්කිනර්
    (3) ප්ලේටෝ, ජීන් රූසෝ, රවීන්ද්‍රනාත් තාගෝර්
    (4) ලියෝ ටෝල්ස්ටෝයි, ගී ද මෝපසාං, බර්ට්‍රන්ඩ් රසල් (.........)

[ 5 වැනි පිටුව බලන්න.

28. පහත සඳහන් අය අතුරින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයට විශිෂ්ට සේවයක් කළ අය පමණක් ඇතුළත් වරණය කුමක් ද?
    (1) ජේ.ඊ. ජයසූරිය, ප්‍රේමදාස උඩගම, බෝගොඩ ප්‍රේමරත්න
    (2) ඩබ්ලිව්.ඒ. සිල්වා, ජී.බී. සේනානායක, මහගම සේකර
    (3) සී.බී. ධනපාල, අර්නස්ට් කොරයා, චන්ද්‍රරත්න මානවසිංහ
    (4) ආනන්ද සමරකෝන්, ගුණසේන ගලප්පත්ති, සුනිල් ශාන්ත (.........)

29. පහත සඳහන් වකවානුවලින් ශ්‍රී ලංකාවේ වැදගත් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඇති වූ වකවානු දැක්වෙන්නේ කුමන වරණයෙන් ද?
    (1) 1920 - 24 , 1948 - 49 , 1966 - 67
    (2) 1934 - 35 , 1941 - 42 , 1969 - 70
    (3) 1943 - 45 , 1960 - 61 , 1980 - 81
    (4) 1952 - 53 , 1976 - 77 , 1989 - 90 (.........)

30. ගුරුවරයකු වශයෙන් තම ඉගැන්වීමේ කාර්යය ස්වයංව වර්ධනය කරගැනීම සඳහා කළ යුතු වන්නේ,
    (1) අධ්‍යාපන මනෝවිද්‍යාව පිළිබඳ පොත් කටපාඩම් කිරීම ය.
    (2) අනෙකුත් ගුරුවරුන් සමග විවිධ කරුණු පිළිබඳව සාකච්ඡා කිරීම ය.
    (3) ශිෂ්‍යයින්ට පිටපත් කර ගැනීම සඳහා සටහන් පිළියෙල කර ගැනීම ය.
    (4) තමා ඉගැන් වූ පාඩම් ප්‍රත්‍යාවේක්ෂණය කර අඩුපාඩු සකස් කර ගැනීම ය. (.........)

● අංක **31** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි **පිළිතුර**, දී ඇති **තිත් ඉරි** මත කෙටියෙන් ලියන්න.

31. පාසලේ සිදුවන වැදගත් දේ පිළිබඳව සටහන් තබා ගන්නා ප්‍රධාන ලේඛනය කුමක් ද?

........................................................................................................................

32. පාසලක අනධ්‍යයන කාර්ය මණ්ඩලයට ඇතුළත් වන්නේ කවරහු ද?

........................................................................................................................

........................................................................................................................

33. පාසලක ශිෂ්‍ය සංඛ්‍යාව එක්තරා ගණනකට වැඩි වේ නම්, සියලුම ළමයින්ට දිවා ආහාරය සැපයේ. එම සංඛ්‍යාව කොපමණ ද?

........................................................................................................................

34. ජපන් රටේ ආධාර ඇතිව දකුණු පළාතේ ඉදිකළ විද්‍යා පීඨය කුමක් ද?

........................................................................................................................

35. අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී ශිෂ්‍යයකු ලබා ගන්නා ලකුණු විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා ප්‍රමිත කරනු ලැබේ. එසේ ප්‍රමිති කළ ලකුණු හඳුන්වන්නේ කුමන නමින් ද?

........................................................................................................................

36. අධ්‍යාපන අමාත්‍යාංශය මෑත දී ආරම්භ කළ පාසල් සංවර්ධන වැඩ සටහන හඳුන්වන්නේ කුමන නමින් ද?

........................................................................................................................

37. තාක්ෂණවේදය සම්බන්ධයෙන් පමණක් උපාධි පිරිනැමීම සඳහා පිහිටුවා ඇති විශ්ව විද්‍යාලය කුමක් ද?

........................................................................................................................

38. ශ්‍රී ලංකාවේ පුස්තකාලවල පොත් වර්ග කිරීම සඳහා භාවිත කරන අංක කිරීමේ ක්‍රමය හඳුන්වන්නේ කුමන නමකින් ද?

........................................................................................................................

[ 6 වැනි පිටුව බලන්න.

39. ශ්‍රී ලංකාවේ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා පවත්වන කාර්මික අධ්‍යාපන ආයතන භාරව කටයුතු කරන ජාතික මට්ටමේ ආයතනය කුමක් ද?

..............................................................................................................................

40. පාකිස්ථානයේ කුඩා දැරියක් රටේ බාලිකාවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් කැපවීම නිසා අන්තවාදින්ගේ උදහසට ලක්විය. එහෙත් ඇය වෙනත් රටකට ගොස් තම අධිෂ්ඨානය ඉටුකර ගැනීමට කටයුතු කළ නිසා ඇයට නොබෙල් ත්‍යාගය හිමි විය. ඇයගේ නම කුමක් ද?

..............................................................................................................................

41. තොරතුරු තාක්ෂණය උපයෝගි කරගෙන පාඩමක් පැහැදිලි කරදීමට යොදාගත හැකි උපකරණය කුමක් ද?

..............................................................................................................................

42. පසුගිය දශක දෙක ඇතුළත ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සඳහා වැඩියෙන්ම ආධාර ලබා දී ඇති ජාත්‍යන්තර ආයතන දෙකක් ඇත. ඉන් එකක් නම් කරන්න.

..............................................................................................................................

43. පාසල් කළමනාකරණයේ දී පාසල් ප්‍රජාව සම්බන්ධකර ගැනීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ආරම්භ කර ඇති වැඩ සටහන කුමක් ද?

..............................................................................................................................

44. මේ රටේ බාලදක්ෂයකුට ලබාගත හැකි ඉහළම සම්මානය කුමක් ද?

..............................................................................................................................

45. ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වල ප්‍රාථමික අවධියේ දී ඉගැන්වීමේ මාධ්‍යය වශයෙන් භාවිත කරන භාෂාවන් කවරේ ද?

..............................................................................................................................

46. පහත සඳහන් වාක්‍යය සම්පූර්ණ කරන්න.

"නිවාඩු ගුරුවරයකුගේ අයිතිවාසිකමක් නොව ........................................................ කි."

47. ස්ථාන මාරුවීම් හිමි රාජ්‍ය සේවාවන් සම්බන්ධයෙන් රාජ්‍ය සේවකයකුට එක් රාජකාරි ස්ථානයක රැඳී සිටිය හැකි උපරිම කාල සීමාව වසර කොපමණ ද?

..............................................................................................................................

48. අනිවාර්යයෙන් ළමයකු පාසලේ සිටිය යුතු අවුරුදු ගණන සම්බන්ධයෙන් රජය මෑත දී ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇත. ඒ අනුව එම අවුරුදු ගණන කොපමණ ද?

..............................................................................................................................

49. පාසල් සංවර්ධන සමිතියක සාමාජිකත්වය ලබාගැනීම සඳහා සාමාජික ගාස්තු නොගෙවා සිටිය හැකි අය කවරහු ද?

..............................................................................................................................

50. ද්විතීයික පාසල් සිසුන්ට සිය හැකියාවන් හා රැකියා වෙළෙඳ පොළෙහි ඇති අවස්ථා අවබෝධකර ගැනීමට උපකාරවන පාසල්වල ක්‍රියාත්මක වැඩ සටහන කුමක් ද?

..............................................................................................................................

※ ※ ※